පසුගිය දින ඉරිදා ලංකාදීප පුවත්පතේ මිනිස් ඝාතනයක් සම්බන්ධ පුවත් වාර්තාවක් පළ වී තිබූ අතර, අපට එම පුවත් වාර්තාව කියැවීමේදී නිරීක්ෂණය කළ හැකි වූයේ එහි අන්තර්ගතය තුළ දිගින් දිගටම එම ඝාතනයට ලක්වූ කාන්තාවගේ බාහිර රූපය සම්බන්ධයෙන් සඳහන් කිරීම් තිබීමයි. ඒ පිළිබඳව අපට ඇසීමට ඇති පැනයන් මෙසේ ගොනු කරමු.

1) ඝාතනයට ලක්වූ කතගේ බාහිර රූපය දිගින් දිගටම විස්තර කිරීම පුවත් වාර්තාවට අදාළ වන්නේ කෙසේද?

2) එම බාහිර රූපය විස්තර කිරීම් පුවත් වාර්තාවට සෘජු අදාළත්වයක් නොදක්වයි නම්, එවන් විස්තර දැක්වෙන්නේ පුවතට ආකර්ෂණයක් ලබාගැනීම සඳහාද?

3) පුවතට ආකර්ෂණයක් ලබාගැනීම සඳහා හෝ එවන් විස්තර දැක්වීම ඔස්සේ, ප්‍රවෘත්තිය තුළ දැක්වෙන සමාජ ගැටළුව හා බැඳි කරුණු කාරණා කෙරෙහි පාඨක අවධානය යොමුවීම අවම නොවන්නේද? ඒ වෙනුවට භාවාතිශය විස්තර රැගත් කතාන්තරයක් පමණක් ඉතිරි නොවන්නේද? එය කෙතරම් මාධ්‍යකරණය විෂයෙහි ආචාර ධාර්මික වන්නේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayLankadeepa
See Less